# පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

## මහනුවර දිස්ත්‍රික්කය.

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මැයි 05 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

බෙල්වුඩ් සෞන්දර්යය නිකේතනයට යන මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ රු.76,415 ක මුදලක් සංශෝධිත මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් යටතේ දෙවරක් ගිණුම්ගත කර තිබුණි.

#### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්.

ගිණුම් විෂයයන් 4 කට අදාළ පාලන ගිණුම් අනුව, ශේෂයන්ගේ එකතුව රු.16,828,280 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව, එම ශේෂයන්ගේ එකතුව රු.10,214,886 ක් වූයෙන්, රු.6,613,394 ක නොසැසඳීමක් අනාවරණය විය.

#### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.

(අ) ලැබිය යුතු ගිණුම්.

2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් විෂයයන් 8 ක එකතු වටිනාකම රු.82,778,319 ක් වූ අතර, එයින් අවුරුදු 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් විෂයයන් හී එකතුව රු.10,188,479 ක් වී තිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්.**

**2016 දෙසැම්බර් 31 දිනට රු.32,365,767 ක් වූ ගෙවිය යුතු ගිණුම් විෂයයන් 2 ක එකතු වටිනාකමින් රු.22,325,137 ක් කර්මාන්ත ණයහිමියෝ වූ අතර, එයින්, අවුරුදු 1 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් විෂයයන් හී එකතුව රු.6,639,416 ක් විය.**

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.**

**ගිණුම් විෂයයන් 5 කට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.12,863,223 ක් වූ ගනුදෙනු විගණනයේ දි සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.**

**1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

**පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.**

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| i | 99 රීතිය | සමාලෝචිත වර්ෂයේ ජනවාරි, පෙබරවාරි හා දෙසැම්බර් මාසවලට අදාළව රු.1,121,459 ක් වටිනා ගෙවීම් වවුචර් 57 කට සහතික කිරීමෙන් තොරව ගෙවීම් කර තිබුණි. |
| ii | 207 හා 208 රීති | විධිමත් ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව රු.532,757 ක් වටිනා ජල උපකරණ, විදුලි උපකරණ හා වෙනත් ද්‍රව්‍ය අවස්ථා 7 කදී මිල දී ගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| iii | **218 රීතිය** | **සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධව වාර්ෂික සමීක්ෂණයක් සිදු කර, සුරක්ෂිත කිරීමට කටයුතු කර නොතිබුණි.** |

(ඇ) **චක්‍රලේඛ.**

| | | |
|---|---|---|
| i | **2006 මැයි 30 දිනැති අංක ආ/7/5/4/11 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය.** | **කාර්යාල කාර්යය සහායක හා කම්කරු තනතුරු දරන සේවකයින්ගේ රාජකාරී වේලාව පෙ.ව.08.00 සිට 16.45 වුව ද, ඔවුන් අදාළ නොවන වෙනත් රාජකාරීවල යොදවා රාජකාරී වේලාව, පෙ.ව.08.30 සිට 16.15 ලෙස 2013 අගෝස්තු 31 දින මහා සභාව විසින් සංශෝධනය කර තිබුණි.** |
| ii | **1992 පෙබරවාරි 26 දිනැති අංක 05/01/119 වෙළුම ix දරන නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය.** | **සැලසුම් කම්ටු රැස්වීම් රාජකාරී වේලාව තුළ පවත්වා සමාලෝචිත වර්ෂය තුළ රු.228,000 ක මුදලක් කම්ටු දීමනා ලෙස ගෙවා තිබුණි.** |
| iii | **1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්වරයාගේ චක්‍රලේඛය** | **1994, 1995 හා 2008 වර්ෂවල දී ගිවිසුම්වලට එළඹ තිබූ දෙල්තොට පොදු වෙළඳ පොළේ කඩ කාමර හිමි බදුකරුවන් 12 දෙනෙකුගේ බදු ගිවිසුම් සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.** |

**2.** මූල්‍ය සමාලෝචනය.
----------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල.
----------------

ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන අනුව, **2016** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.**33,941,501** ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.**16,481,289** ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.**17,460,212** ක වර්ධනයක් දක්නට ලැබුණි.

**2.2** ආදායම් පරිපාලනය.
----------------------

**2.2.1** ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය.
--------------------------------------

වරිපනම්, බදු කුලී, බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනට රු.**58,667,352** ක ශේෂයක් හිඟ හිටව පැවතුණි.

**2.2.2** වරිපනම්.
----------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි **01** දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.**4,975,244** ක් වූ අතර, ඉන් වර්ෂය තුළදී රු.**408,963** ක් අය කර ගෙන තිබුණි. වර්ෂයේ බිල් කළ ආදායම රු.**2,657,975** ක් වූ අතර, ඉන් රු.**1,565,819** ක් අය කර ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී හිඟයෙන් හා බිල් කිරීම්වලින් අය කර ගැනීමේ ප්‍රතිශතය පිළිවෙළින් සියයට **8** ක් හා සියයට **58** ක් වූ අතර, දෙසැම්බර් **31** දිනට හිඟ ශේෂය රු.**5,658,437** ක් විය.

(ආ) **2008** වර්ෂයේ තක්සේරුව පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂයේදීත් වරිපනම් අය කර තිබුණි.

(ඇ) වර්ෂ **10** කට වඩා වැඩි කාලයක සිට රාජ්‍ය ආයතන **9** කින් හිඟහිට තිබූ රු.**997,598** ක වරිපනම් බදු මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3** බදු කුලී.
----------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දින වන විට තලාතුඔය අංක **3** කඩ කාමරයෙන් වසර **8** කටත් පෙර සිට අය විය යුතු රු.**231,410** ක බදු කුලී අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව, මස් කඩ කුලී හිඟ ශේෂය රු.706,067 ක් ලෙස දක්වා ඇතත්, විගණන අවස්ථාවේ ලබා දී තිබූ ආදායම් විශ්ලේෂණ වාර්තාවේ මස් කඩ කුලී හිඟ ශේෂය රු.744,812 ක් වී තිබුණි. එසේ වුවත්, අදාළ කඩ කාමර ලේඛන පරීක්ෂා කිරීමේ දී සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.842,632 ක හිඟ ශේෂයක් පැවතිණි.

2.2.4 වෙනත් ආදායම්.
--------------------

(අ) ජල ගාස්තු.
--------------

ප්‍රාදේශීය සභාව සතු ජල ව්‍යාපෘති 5 ක ජල මනු සවි කිරීමකින් තොරව ස්ථාවර ගාස්තුවක් අය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.14,341,165 ක ජල ගාස්තු ශේෂයක් අය විය යුතුව තිබුණි.

(ආ) අක්කර බදු.
--------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි අක්කර බදු ශේෂය රු.1,023,444 ක් වූ අතර, මෙම ශේෂය 2013 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් තිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු.
---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.1,424,904 ක් හා මුද්දර ගාස්තු රු.33,852,820 ක් අය වියයුතුව තිබුණි. 2009 සිට 2013 දක්වා කාල පරිච්ඡේදයට අදාළව අය විය යුතු රු.3,743,497 ක මුද්දර ගාස්තුවක් ද ඊට ඇතුළත්ව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය.
---------------------------

3.1 කාර්යසාධනය.
--------------------

(අ) සභා අරමුදල් යටතේ සමාලෝචිත වර්ෂයේ රු.5,735,000 ක් වූ ව්‍යාපෘති 26 ක් හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර කර්මාන්ත 18 ක් අනුමත කර ගෙන තිබුණ ද, ඉන් ව්‍යාපෘති 4 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අනවදානයෙන් හා අවශ්‍යතාවය නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව ව්‍යාපෘති තෝරා ගැනීම හේතුවෙන්, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් අනුමත කර තිබූ රු.1,900,000 ක වටිනා ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහනට අදාළ ව්‍යාපෘති 3 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ)** **සමාලෝචිත වර්ෂයේ උපයා ගත් රු.51,902,400 ක පුනරාවර්තන ආදායමින් සංවර්ධන කටයුතු සඳහා වැය කර තිබුණේ රු.12,406,467 ක් වූ සියයට 23.9 ක ප්‍රතිශතයක් පමණි.**

**(ඈ)** **සමාලෝචිත වර්ෂයේ මහජන සෞඛ්‍ය වැඩසටහන් යටතේ වැය විෂයයන් 2 කට වෙන් කර තිබූ රු.575,000 ක් අරමුණුගත කාර්යයන් ඉටු කිරීමට උපයෝගී කර ගැනීමකින් තොරව ඉතිරි කර තිබුණි.**

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා.**

**----------------------------------**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ)** **අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය අතර තනතුරු 29 ක පුරප්පාඩු හා තනතුරු 14 ක අතිරික්තතා පැවතුණි.**

**(ආ)** **කාර්යාල කාර්ය සහායක, ක්ෂේත්‍ර කම්කරු, මුරකරු හා පුස්තකාල සහායක තනතුරු දරන පුද්ගලයින් 13 දෙනෙකු කාර්යාලගත ආදායම් අය කිරීම, පරිපාලන කටයුතු, වාහන පාලනය යනාදී වගකිවයුතු සේවාවන් හී යොදවා තිබුණි.**

**(ඇ)** **2011, 2012 හා 2013 වර්ෂවල දී සේවා නියුක්ත භාර අරමුදලට දායක මුදල් ගෙවීමේ ප්‍රමාදය මත රු.31,255 ක් අධිභාර වශයෙන් ගෙවීමට සිදුව තිබුණි.**

**(ඈ)** **සභාව සතු කැබ් රථයක් 2015 මැයි 14 දින අනතුරකට භාජනය වී ඇතත්, 2016 නොවැම්බර් 9 දින වන විටත් මු.රෙ.104(4) ප්‍රකාරව පරීක්ෂණයක් සිදු කර වගකිව යුතු පාර්ශවයන් නිශ්චය කර නොතිබුණි.**

**3.3** **මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

**------------------------------**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ)** **2014 සිට 2016 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ගොඩනැගිලි අයදුම්පත් 823 ක් ලැබී අයදුම්පත් 586 ක් අනුමත කර ඇතත්, අනුකූලතා සහතික 56 ක් පමණක් නිකුත් කර තිබුණි.**

**(ආ)** **අවිධිමත් තොරතුරු පදනම් කර ගෙන 2016 වර්ෂයේ ත්‍රී රෝද රථ ගාස්තු බිල් කිරීම හා ත්‍රී රෝද රථ හිමියන් ගාස්තු නොගෙවීම යනාදි හේතු මත ත්‍රී රෝද රථ 128 කින් සමාලෝචිත වර්ෂය සඳහා අය විය යුතු රු.460,800 ක මුදලක් ගිණුම්වලින් කපා හැරීමට 2017 අප්‍රේල් 18 දින අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි.**

(ඇ) පොදු ගබඩාව පරික්ෂාවේ දී රු.71,070 ක් වටිනා විදුලි උපකරණ අයිතම 6 ක අතිරික්තයක් හා රු.25,580 ක වටිනා අයිතම 6 ක ඌනතාවයක් පැවතුණි.

3.4 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්.
---------------------------------------
රු.1,019,000 ක් වටිනා ට්‍රැක්ටරයක් හා ට්‍රේලරයක් 2013 වර්ෂයේ සිට අක්‍රීයව විනාශ වීමට ඉඩ හැර තිබුණි.

3.5 ඝන අප ද්‍රව්‍ය කළමනාකරණය.
-------------------------------------
සභා බල ප්‍රදේශයේ කසළ ටොන් 15 ක් පමණ සතියකට එක් රැස් වන අතර, දිරන කසළ කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා යොදා ගෙන තිබුණත්, පොහොර හැලීම කම්කරුවන් යොදා අතින් කරකවන යන්ත්‍රයක් මගින් සිදු කර තිබුණි. කොම්පෝස්ට් අළෙවි කිරීම හා බෙදා හැරීම සඳහා ප්‍රමාණාත්මක වැඩපිළිවෙළක් අනුගමනය නොකිරීමෙන්, කසළ අංගනයේ විශාල ලෙස ඇසුරුම් නොකරන ලද කොම්පෝස්ට් තොග ගොඩ ගැසි තිබුණු අතර, නොදිරන කසළ ඉවත් කිරීම කෙරෙහි ද සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය .
---------------------------------------------

4.1 අයවැය පාලනය.
-------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, සත්‍ය ආදායම් හා වියදම් අතර ආදායම් විෂයයන් 2 ක හා වියදම් විෂයයන් 7 ක සියයට 25 සිට සියයට 100 දක්වා විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි.

(ආ) වැය විෂයයන් 40 ක් සඳහා වෙන් කර ගෙන තිබූ රු.5,469,500 ක ප්‍රතිපාදන එම කාර්යයන්ට යෙදවීමකින් තොරව ඉතිරි කර තිබුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.
-----------------------------------
සමාලෝචිත වර්ෂයේ රු.56,554,902 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

4.3 සංයුක්ත සැළැස්ම.
----------------------
සමාලෝචිත වර්ෂය ආවරණය වන පරිදි සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.

**4.4 ක්‍රියාකාරී සැළැස්ම.**

**----------------------**

**සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.**

**4.5 අභ්‍යන්තර විගණනය.**

**-------------------------**

**අභ්‍යන්තර විගණන විෂයය පවරා තිබූ නිලධාරිනියට වෙනත් විවිධ රාජකාරී පවරා තිබීම හේතුවෙන්, ස්වාධීන හා ප්‍රමාණවත් විගණනයක් කිරීමේ හැකියාව මග හැරී තිබුණි.**

**5. පද්ධති හා පාලනය.**

**-----------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.**

**(අ) ආදායම් පරිපාලනය**

**(ආ) වත්කම් කළමනාකරණය**

**(ඇ) මූල්‍ය පාලනය**

**(ඈ) ණයගැතියෝ හා ණයහිමියෝ**

**(ඉ) ගබඩා පාලනය**

**(ඊ) අයවැය පාලනය**